CP

32

පොදු චක්‍රලේඛ ලිපි අංක 02-107/2006

මගේ අංකය සීඑෆ්/ඊඑක්ස්ඩී/03/2006
සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය,
සුවසිරිපාය,
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

2006.06/01 වන දින.

පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්,
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
නියෝජ්‍ය පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
විමධ්‍යගත කොට්ඨාශ භාර ප්‍රධානීන්,
රෙජීය අමාත්‍යාංශය යටතට ගැනෙන්
සියලුම රෝහල් අධ්‍යක්ෂවරුන් හා
ආයතන ප්‍රධානීන් වෙත.

වෛද්‍ය පර්යේෂණාගාර කාර්මික විද්‍යාඥ II පන්තිය "අ" ඛණ්ඩයේ කාර්යක්ෂමතා කඩඉම් හා දෙපාර්තමේන්තු පරීක්ෂණය - 2006

වෛද්‍ය පර්යේෂණාගාර කාර්මික විද්‍යාඥ II පන්තිය "අ" ඛණ්ඩයේ නිලධාරීන් සඳහා අනුමත වැටුප් ක්‍රමයේ ඇතැරඳින වැටුප් පියවරට එළඹීමට පෙර සමත් විය යුතු වන කාර්යක්ෂමතා කඩඉම් හා දෙපාර්තමේන්තු පරීක්ෂණය 2006.07.30 වන දින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. විභාගය පවත්වනු ලබන ස්ථානය හා කාලසටහන ප්‍රවේශපත්‍රයේ සඳහන් කරනු ඇත.

02. **සුදුසුකම්**

මෙම විභාගයට අයදුම් කළ හැක්කේ වෛද්‍ය පර්යේෂණාගාර කාර්මික විද්‍යාඥ II "අ" ඛණ්ඩයට උසස් කර ඇති නිලධාරීන්ට හා II "ආ" ඛණ්ඩයේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් වී නියමිත සේවා කාලය සම්පූර්ණ කර ඇතත් ආයතනයේ ප්‍රමාද දෝෂයන් හේතුවෙන් II "අ" ඛණ්ඩයට පත්කර නොමැති නිලධාරීන්ට පමණි.

03. **අයදුම්පත්**

මෙම චක්‍රලේඛයේ අගට දක්වා ඇති ආකෘතිය අනුව අයදුම්කරුවන් විසින් සකස් කරගත යුතු අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින්, කොළඹ 10,පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, අංක 385, සුවසිරිපාය ගොඩනැගිල්ලේ අධ්‍යක්ෂ (විභාග) වෙත 2006.06.30 දින හෝ ඊට පෙර ලැබෙන සේ ලේඛනගත තැපෑලෙන් එවිය යුතුය. සෑම අයදුම්පතකම දක්වා ඇති තොරතුරු නිවැරදි බව කොට්ඨාශ ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය. තම අයදුම්පත සමග ලිපිනය ලියනලද රු.5.00 ක් වටිනා මුද්දර ඇලවූ 9"X4" ප්‍රමාණයේ ලියුම් කවරයක් ද එවිය යුතුය. (මෙහි කැමති පරිදි රාජකාරී ලිපිනය හෝ පෞද්ගලික ලිපිනය ලිවිය හැකිය.) ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්ද, අසම්පූර්ණ හෝ වැරදි සහිත වන අයදුම්පත්ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. **විභාග ගාස්තු**

I. විභාගයට පළමුවන වතාවට ඉදිරිපත් වන අයදුම්කරුවන් විභාග ගාස්තුවලින් නිදහස් කරනු ලැබේ. අනෙකුත් අයදුම්කරුවන් එක් විෂයකට රු. 25/- බැගින් අවිඉංගු නොකල මුද්දර ඉල්ලුම් පත්‍රයේ අලවා තමන්ගේ අත්සන හා දිනය යොදා අවලංගු කළ යුතුය.

II. කිසිදු කරුණක් මත ගෙවන ලද විභාග ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ ආපසු ගෙවීමක් සිදුකරනු නොලැබේ.

05. විභාගයට ඇතුළත් කර ගැනීම.

I. පළිගත් අයදුම්පත් සඳහා අපේක්ෂකයන්ට ප්‍රවේශපත් නිකුත්කරනු ලැබේ. එම ප්‍රවේශපත් නියමිත පරිදි සම්පූර්ණ කර ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.

II. විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විසින් විභාග ශාලාවතුළදී විභාග ශාලාධිපතිට ස්වකීය අනන්‍යතාවය තහවුරු කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියකියවිලි අතුරින් එකක් ඉදිරිපත් කළ යුතුය.

(අ) පුද්ගල හැඳුනුම්පත්‍රය.
(ආ) දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන හැඳුනුම්පත්‍රය
(ඇ) රියදුරු බලපත්‍රය.
(ඈ) ගමන් බලපත්‍රය

06. විභාග පරිපාටිය

මෙම විභාගය ලිඛිත, ප්‍රශ්න පත්‍ර දෙකකින් සහ වාචික හා ප්‍රායෝගික යැයි කොටස් හතරකින් සමන්විතය. එක් එක් කොටසක් සඳහා ලකුණු 100 බැගින් වෙන් කෙරේ. සමත්වීම සඳහා එක් කොටසකට අවම වශයෙන් ලකුණු 40ක් ලබාගත යුතුය. එක්වරකදී හෝ කිහිපවරකදී කොටස් වශයෙන් පෙනී සිට විභාගය සම්පූර්ණ කළ හැකිය.

07. විභාග නිර්දේශ මාලාව

07:1 දෙපාර්තමේන්තු පරීක්ෂණය

07:1:1 විෂයානුබද්ධ ප්‍රශ්න පත්‍රය (ලිඛිත)

කාලය පැය 03 යි. ප්‍රශ්න 07 කින් ප්‍රශ්න 04 කට පිළිතුරු සැපයිය යුතුය. මුළු ලකුණු 100 කි.

විෂය නිර්දේශය

1 රසායනාගාර තාක්ෂණවල මූලධර්ම හා ප්‍රගුණ කිරීම.
(අ) අනුජීව විද්‍යාව.
(ආ) රසායන ව්‍යාධිවේදය.
(ඇ) රක්ත වේදය.
(ඈ) සායන ව්‍යාධිවේදය.
(ඉ) පටක ව්‍යාධිවේදය.

11. රසායනාගාර කළමණාකරණය.

111. උපකරණ නඩත්තුව හා අලුත්වැඩියා කිරීමේ ක්‍රියාවලිය.

1v. රසායනාගාරයේ ආරක්ෂා පිලිවෙල.

v. දෙපාර්තමේන්තු ක්‍රියා පරිපාටිය.
(අ) උපකරණ, රසායන ද්‍රව්‍ය යනාදිය ඉල්ලුම් කිරීම.
(ආ) ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ ඉවත් කිරීමේ ක්‍රියා පිලිවෙත.
(ඇ) රසායන ද්‍රව්‍ය ලබා ගැනීම, ගබඩා කිරීම, නිකුත් කිරීම හා ගණන් තැබීම.

07:1:2 ප්‍රායෝගික පරීක්ෂණය - විෂය ක්ෂේත්‍රයට අදාලව හැකියාවන් හා ක්‍රියාකාරකම් හා බැඳුනු ප්‍රායෝගික පරීක්ෂණයකි. මුළු ලකුණු 100කි.

07:1:3 වාචික පරීක්ෂණය - විෂය ක්ෂේත්‍රයට අදාලව හා සේවයේ යෙදීමේදී එළඹිය හැකි ගැටළු පිළිබඳ වාචික පරීක්ෂණයකි. මුළු ලකුණු 100කි.

07:02 කාර්යක්ෂමතා පරීක්ෂණය (කාර්යාල පරිපාලනය, ආයතන සංග්‍රහය සහ මුදල් රෙගුලාසි)

ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකි. කාලය පැය 1 1/2කි. මුලු ලකුණු 100කි. එක් කොටසකින් ප්‍රශ්න හතර (04) බැගින් ප්‍රශ්න අට (08) ක ප්‍රශ්න පත්‍රයක් සකස් කරනු ඇත. එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙක (02) බැගින් තෝරාගෙන තවත් එක් ප්‍රශ්නයක් ද ඇතුළුව ප්‍රශ්න පහ (05) කට පිළිතුරු සැපයිය යුතුය.

ආයතන සංග්‍රහය

පරිච්ඡේද :- II - සේවයට බඳවා ගැනීමේ කාර්ය පරිපාටිය සහ පත් කිරීම්.
VIII - අතිකාල දීමනා, නිවාඩු දින සහ නිවාඩු දින සඳහා වැටුප් හා දීමනා
XII - නිවාඩු
XIII - දුම්රිය බලපත්‍ර
XVI - නිවාඩු ගමන්
XXVIII - පරිපාලන කාර්ය පරිපාටිය සහ විධි
XXX - රජයේ නිළධාරීන් සම්බන්ධයෙන් ආණ්ඩුව සතු බලතල.
XLVII - සාමාන්‍ය හැසිරීම සහ විනය

මුදල් රෙගුලාසි :

ඒකාබද්ධ අරමුදල.

වාර්ෂික ඇස්තමේන්තු.

වාර්ෂික ඇස්තමේන්තු වෙනස් කිරීම

ප්‍රධාන ගණක නිළධාරීන්, ගණක නිළධාරීන්, ආදායම් ගිණුම් නිළධාරීන්

ගෙවීම් සඳහා බලය පැවරීම.

අනුමත කිරීම

ඉහතින් කිරීම

පාඩු හා අත්හැර දැමීම්

රාජ්‍ය අරමුදල් භාරකාරත්වය, ගෙවීම් සහ ලැබීම් සම්බන්ධ ක්‍රියාවලිය.

අඟරු වෙක්පත්

රාජ්‍ය මුදල් වල සුරක්ෂිතභාවය.

සමීක්ෂණ මණ්ඩලය.

අයිරාවන්.

බැංකු ගිණුම්

ගබඩා තොග හරි වැරදි බැලීම, භාර ගැනීම, ලබා ගැනීම හා සැපයීම පිළිබඳ කාර්ය පරිපාටිය.

කොන්ත්‍රාත්තු - ටෙන්ඩර් පිළිවෙතින් බැහැර වීම.

08. කරුණාකර මෙම චක්‍රලේඛයේ අඩංගු දැ, ඔබ කොට්ඨාශයේ /විශේෂිත ව්‍යාපාරයේ/ආයතනයේ සේවයේ නියුතු අදාල නිලධාරීන්ගේ දැනගැනීමට සලස්වන්න. මෙම තොරතුරු www.health.gov.lk වෙබ් අඩවියේ ද ඇතුළත් කර ඇත.

(ඩබ් ජී විමලසේන)
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන)
සෞඛ්‍ය ලේකම් වෙනුවට.

W. G. WIMALASENE
Deputy Director General
(Administration)

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි

ආදර්ශ අයදුම්පත

වෛද්‍ය පර්යේෂණාගාර කාර්මික විද්‍යාඥ II වන පංතියේ "අ" ඛණ්ඩයේ නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් හා දෙපාර්තමේන්තු පරීක්ෂණය - 2006

01. (අ) I. අයදුම්කරුගේ නම (සිංහලෙන් හෝ දෙමළෙන්, මුලකුරු අගට යොදා ලියන්න) - .....

.....

II. අයදුම්කරුගේ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්, මුලකුරු අගට යොදා ලියන්න) :-

III. මුලකුරු වලින් හැඳින්වෙන නම් (සිංහලෙන් හෝ දෙමළෙන්) - .....

.....

IV. මුලකුරු වලින් හැඳින්වෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :-

(ආ) I. මුල් පත්වීමේ දිනය - .....

II. "අ" ඛණ්ඩයට පත් කරන ලද දිනය - .....

III සේවයේ ස්ථිර කරන ලද දිනය හා ලිපි අංකය - .....

IV II "ආ" ඛණ්ඩයේ කාර්යක්ෂමතා කඩඉම් } .....

පරීක්ෂණය සමත්වූ දිනය සහ ගොනු අංකය } .....

V. දැන් ලබන වාර්ෂික වැටුප - .....

02. ඔබ මෙවර පෙනී සිටීමට බලාපොරොත්තු විෂයයන් ඉදිරියේ ඇති කොටුව තුළ (✓) ලකුණ යොදන්න. පෙනී නොසිටින්නේ නම් (X) ලකුණ යොදන්න.

විෂයානුබද්ධ		ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි	
ප්‍රායෝගික පරීක්ෂණය		වාචික පරීක්ෂණය	

03. (අ) දැන් සේවය කරන ආයතනය :- .....

(ආ) එය අයත් දිස්ත්‍රික්කය :- .....

(ඇ) විභාග ප්‍රවේශ පත්‍රය එවීම සඳහා නිවැරදිව හා පැහැදිලිව ලිපිනය ලියන ලද 9"x4" ප්‍රමාණයේ, රු.5.00 ක මුද්දර ඇලවූ ලියුම් කවරයක් අයදුම්පත්‍රයට අමුණන ලද්දේද?

(ඈ) 1. තැපැල් ලිපිනය (සිංහලෙන් හෝ දෙමළෙන්) .....

.....

2. තැපැල් ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) - .....

04. විභාගයට පෙනී සිටින මාධ්‍යය - (සිංහල / දෙමළ / ඉංග්‍රීසි) :- .....

05. (අ) මීට ප්‍රථම මෙම විභාගයට පෙනී සිටියේද? .....

(ආ) ප්‍රථම වතාවට නොවේනම් මුද්දර අලවා තිබේද?

මුද්දර කොටුව.

06. අයදුම්කරුගේ සහතිකය

මගේ දැනුම හා විශ්වාසය පරිදි,

(I) මෙම ඉල්ලුම් පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවත්, මෙම විභාගයට මා පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බැවින් විභාග ශාස්තු ගෙවීම අනවශ්‍ය බවත් / ප්‍රථම වතාවට නොවන බැවින් රු. ..... ක් වටිනා මුද්දර අලවා ඇති බවත්* මෙම ඉල්ලුම් පත්‍රයට මා විසින් අලවා ඇති මුද්දර අවලංගු කිරීමට පෙර වලංගුවූ පාවිච්චි නොකරන ලද මුද්දර බවත් ප්‍රකාශ කරමි.

(II) සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් විභාග පිළිබඳව පනවා ඇති නීතිරීති වලට එකඟව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, මගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන කවර හෝ තීරණයකට මම එකඟ වන බවත් මෙයින් සහතික කරමි.

.....
අයදුම්කරුගේ අත්සන.

දිනය 2006.....

ආයතන ප්‍රධානියාගේ සහතිකය

..... මහතා / මිය / මෙනවිය* මා හොඳින් දන්නා අයකු වන අතර, මෙම විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට / නොවන* බවටද රු...../- ක් වටිනා මුද්දර මෙම ඉල්ලුම් පත්‍රයට අලවා ඇති බවද / මුද්දර ඇලවීමට අනවශ්‍ය බවටද* මා ඉදිරිපිටදී අත්සන් කළ බවද සහතික කරමි.

.....
දිනය 2006 ..... ආයතන ප්‍රධානියාගේ අත්සන.

විමධ්‍යගත කොට්ඨාශ /විශේෂිත ව්‍යාපාර* ප්‍රධානියාගේ සහතිකය

.....මහතා / මිය / මෙනවිය* II වන ශ්‍රේණියේ 'අ' ඛණ්ඩයේ වෛද්‍ය පර්යේෂණාගාර කාර්මික විද්‍යාඥයෙකු වශයෙන් මගේ කොට්ඨාශයේ / ව්‍යාපාරයේ* සේවය කරන බවත්, අයදුම්පතේ දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට* සුදුසුකම් ඇති බවත් සහතික කරමි.

.....
විමධ්‍යගත කොට්ඨාශ / විශේෂිත
ව්‍යාපාර ප්‍රධානියාගේ අත්සන
(මුද්‍රාව තැබිය යුතුය)

දිනය 2006 .....

(* - අනවශ්‍ය කොටස් කපා හරින්න.)